08978

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

විභාග අංකය : ..........................................

| | |
|---|---|
| I කොටස | |
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

* **I** කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, **II** කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* **II** කොටස – **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

● නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**1.** වර්ණ සතරට ම සහභාගී විය හැකි ලෙස නිපැයූ වේදය කුමක් ද?
(1) ඍග් (2) සාම (3) නාට්‍ය (4) යජුර් (5) අථර්ව (.........)

**2.** ආංගික අභිනයට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) ඉදිරියට පැමිණැවීම යන අර්ථය දෙයි.
(2) පුස්ත, අලංකාර, අංග රචනා හා සජ්ජීව ආංගික අභිනයට අයත් වේ.
(3) නළු-නිළියන් වේදිකාවේ සිටගන්නා ක්‍රමය යි.
(4) හස්ත හා පාදවල සංයෝගය යි.
(5) නළුවා අංග, ප්‍රත්‍යංග හා උපාංග මගින් අදහසක් පළ කිරීම යි. (.........)

**3.** නෘත්‍යයට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) නෘත්‍යයට රිද්මයක් තිබුණ ද ඉන් අර්ථයක් ප්‍රකාශ නො වේ.
(2) මනෝභාවයක් ප්‍රකට නොවන නර්තනයකි.
(3) නාට්‍ය සඳහා නෘත්‍යයෙන් පිටුවහලක් නො ලැබේ.
(4) ආංගික හා සාත්ත්වික අභිනයන් උපයෝගී වන නර්තනයකි.
(5) අභිනයදර්පණයෙහි නෘත්‍යය පිළිබඳ ව සඳහන් නො වේ. (.........)

**4.** ලෝකධර්මී ශෛලියේ ලක්ෂණ ඇතුළත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ලෝකයෙහි සිදු වන යමක් වේදිකාව මත ඒ අයුරින් ම සිදු කිරීම.
(2) ලාලිත්‍යයෙන් යුතු අංග චලනයෙන් යුක්ත වීම.
(3) කාලීන ප්‍රවෘත්තියක් වස්තු විෂය වශයෙන් නොතෝරාගැනීම.
(4) අංග රචනය හා රංගාලෝකයට උපරිම ඉඩක් සැලසීම.
(5) පසුතල හා නාට්‍යෝපකරණ අවම වශයෙන් උපයෝගී කරගැනීම. (.........)

**5.** "දශරූපක" යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?
(1) සංස්කෘත නාට්‍යයේ නාට්‍යධර්මී රූපණය සම්බන්ධ අභ්‍යාස දහයකි.
(2) ලිඛිත පිටපත් සහිත සංස්කෘත නාට්‍ය ප්‍රභේද දහය යි.
(3) අංක සංඛ්‍යාව දහයකින් යුක්ත වූ නාට්‍ය වර්ගය යි.
(4) භරතමුනි රචනා කොට ඇති ග්‍රන්ථයකි.
(5) මහාකවි කාලිදාස ප්‍රබන්ධ කළ නාට්‍යයකි. (.........)

[දෙවැනි පිටුව බලන්න.

- පහත සඳහන් මාතෘකා අධ්‍යයනය කොට අංක **6 - 10** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| A - බැලසන්ත | F - එන්ගෙකි | K - හලාවත | P - ගිගකු |
| B - හයිෂි | G - බූසු | L - ජිදයිමොනො | Q - ජීවිත ගර්වය |
| C - කන්තාරු | H - ගොල්ගොතා | M - බොරලැස්ස | R - ඇනී බොතේජු |
| D - ඔකුනි | I - ගාබ්‍රියෙල් ප්‍රනාන්දු | N - සති පිරිත | |
| E - දේව දූතයා | J - විහාර අස්න | O - බූතයි | |

**6.** නාඩගම් සම්ප්‍රදායට අදාළ වන්නේ,
(1) A, C හා H ය. (2) A, I හා K ය. (3) E, I හා K ය. (4) H, I හා M ය. (5) H, I හා R ය. (.........)

**7.** නෝ නාට්‍ය කලාවට අදාළ වන්නේ,
(1) B, F හා L ය. (2) B, G හා O ය. (3) B, G හා L ය. (4) D, F හා P ය. (5) F, L හා O ය. (.........)

**8.** නාට්‍යමය ලක්ෂණ සහිත බෞද්ධ පූජාකර්ම හා සම්බන්ධ වන්නේ,
(1) C, H හා I ය. (2) C, I හා M ය. (3) E, H හා Q ය. (4) E, J හා N ය. (5) I, M හා N ය. (.........)

**9.** කබුකි නාට්‍ය කලාවට අදාළ වන්නේ,
(1) B, G හා L ය. (2) D, F හා G ය. (3) D, F හා L ය. (4) E, G හා Q ය. (5) G, L හා D ය. (.........)

**10.** ශ්‍රී ලාංකේය කිතුනු ජන වන්දනා නාට්‍යයට අදාළ වන්නේ,
(1) A, E හා M ය. (2) C, H හා M ය. (3) C, H හා N ය. (4) E, H හා M ය. (5) E, M හා Q ය. (.........)

**11.** ලංකාවේ පාස්කු නාට්‍යයේ ප්‍රධාන තේමාව වන්නේ,
(1) ජේසු තුමන් සිය අනුගාමිකයන් සමග අවසාන රාත්‍රි භෝජනය ගැනීම ය.
(2) ජයඝෝෂා මධ්‍යයේ ජෙරුසලම් නුවරට වැඩම කිරීම ය.
(3) පිලාත් ආණ්ඩුකාරයා ජේසු තුමන් මරණයට තීන්දු කිරීම ය.
(4) ජේසු තුමන් කුරුසපත් කිරීම ය.
(5) කුරුසපත් වීම හා ඉන් තෙදිනකට පසු උත්ථානය වීම ය. (.........)

**12.** භික්ෂූන් දෙනමක් විසින් පවත්වනු ලබන නාට්‍යමය ලක්ෂණ සහිත බෞද්ධ පූජා කර්මය තෝරන්න.
(1) මිලින්ද ප්‍රශ්නය (2) දොරකඩ අස්න (3) යුගාසන බණ
(4) සති පිරිත (5) සූවිසි විවරණය (.........)

**13.** කොහොඹා කංකාරියේ එන ගබඩා කොල්ලය නම් අංගය පැවැත්වීමේ අරමුණ කුමක් ද?
(1) වස් දොස් දුරු කිරීම
(2) හාස්‍යය මතුකොට දැක්වීම
(3) ගම්වැසියන් එකතු කළ ආහාර ද්‍රව්‍ය බෙදාදීම
(4) ශාන්තිකර්මයක් අවසන් කිරීමට පෙර සියලු ආම්පන්න ගිනි තැබිය යුතු වීම
(5) දෙවියන්ට වෙන් කළ ද්‍රව්‍ය නරයන් අතට පත් නොවනු පිණිස (.........)

**14.** සන්නියකුම යාගයේ ගොටු සතරක් සහිත ඉණ හැඩයක් පළඳින්නේ කුමන සන්නිය ද?
(1) දේව (2) මහා කෝල (3) අමුක්කු
(4) බිහිරි (5) ඉර මුදුන් (.........)

**15.** රිද්දි යාගයේ "කපු යක්කාරියේ" දී අනුකරණය කොට දැක්වෙන්නේ කුමන අවස්ථාවක් දැ යි තෝරන්න.
(1) රිද්දි බිසව් උපන් ආකාරය නිරූපණය කිරීම යි.
(2) පැදුරේ දැපවිල්ල රඟ දැක්වීම යි.
(3) බිසව් හත්දෙනා හේනක් කොටන ආකාරය යි.
(4) සිවුරක් සකසා දීපංකර බුදුන්ට පූජා කිරීමේ ක්‍රියාවලිය යි.
(5) සත් බිසෝවරුන් ස්නානය පිණිස යාමට සූදානම් වීම යි. (.........)

**16.** මඩු ශාන්තිකර්මවල මංගර දෙවියන් පුදනු පිණිස පැවැත්වෙන පෙළපාලිය තෝරන්න.
(1) අඹ විදමන හා මරා ඉපැද්දීම
(2) රාම මැරීම හා මරා ඉපැද්දීම
(3) දෙවොල් ගොඩ බැසීම හා ගිනි පෑගීම
(4) යහන් දැක්ම හා හළං වැඩීම
(5) ඇත් බන්ධනය හා මී බන්ධනය (.........)

[තුන්වැනි පිටුව බලන්න.

**17.** සොකරි ගැමි නාට්‍යය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සුළු ප්‍රාදේශීය වෙනස්කම් තිබුණ ද, සොකරියට පාදක වන්නේ එක ම පුවතකි.
(2) සොකරි ගැමි නාටකයෙහි කිසි ම ආකාරයක වෙස් මුහුණු පැළඳීමක් සිදු නො වේ.
(3) නැව් තැනීම, දියත් කිරීම, ගොඩ බැසීම කවියෙන් පමණක් විස්තර වේ.
(4) සොකරියට සහභාගී වන්නන් පේ වීමේ චාරිත්‍රයක් වර්තමානයේ නැත.
(5) සොකරියේ අනුරූපණ සිදු වන්නේ ලෝකධර්මී ශෛලියට ය. (.........)

**18.** කෝලම් නාටකයක 'කෝලම් උපත' ගායනා කරන්නේ කවුද?
(1) ආරච්චි කෝලම (2) අණබෙර කෝලම (3) කාරියකරවන රාළ
(4) මුදලි කෝලම (5) පේඩිරාළ (.........)

**19.** "දූල් නිමල් සිසි සේ දිසි සරදඹරේ" නම් ගීතය ඇත්තේ කුමන නාඩගමේ ද?
(1) සුළඹාවතී (2) සිංහවල්ලී (3) රජතුන් කට්ටුව
(4) ඉයුජින් (5) හරිශ්චන්ද්‍ර (.........)

**20.** ජෝන් ද සිල්වාගේ නූර්ති අතර කාලීන සමාජ අත්දැකීමක් පාදක කොටගත් නාට්‍යය තෝරන්න.
(1) මිම්මට මිම්ම (2) පරාභව (3) නාගානන්ද
(4) පරංගි හටන (5) අලකේශ්වර චරිතය (.........)

● ප්‍රශ්න අංක **21** සිට **25** දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා වරණ පහක් බැගින් සපයා ඇත. ඒ අතර සෙසු පද හා **නොගැළපෙන** පදය තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**21.** (1) උත්තර රාම චරිතය (2) මායාදුන්නේ (3) ප්‍රතාප් සිං
(4) පිටිසර කෙල්ල (5) සිංහලේ හෙවත් සිංහල වීරයා (.........)

**22.** (1) චාල්ස් ඩයස් (2) එම්.ජී. පෙරේරා (3) පීටර් ද සිල්වා
(4) සී. දොන් බස්තියන් (5) බී.ඇල්. බෝධිපාල (.........)

**23.** (1) වළහා (2) මගුල් ප්‍රස්ථාව (3) මැනේජර්
(4) වෙද හටන (5) වැරදුණු කුරුමානම (.........)

**24.** (1) වඩමෝඩි (2) සංකරම් (3) තෙන්මෝඩි
(4) වඩපාංග (5) තෙන්පාංග (.........)

**25.** (1) වෙල්ලකට්ටර (2) කලරි (3) වෙන්බා
(4) තිරුවිලා (5) විලක්කු (.........)

**26.** නවරාත්‍රි මංගල්‍යයේ දී ශක්තිය හා බලය ලබාගැනීම සඳහා පූජා පැවැත්වෙන්නේ කවර දෙවඟන උදෙසා ද?
(1) දුර්ගා (2) ලක්ෂ්මී (3) මහා පරාශක්ති
(4) සරස්වතී (5) පාර්වතී (.........)


**27.** ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය කලාව පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ඊ.එෆ්.සී. ලුඩොවයික් ඉංග්‍රීසි වේදිකාව සඳහා විදේශීය නාට්‍ය පිටපත් තෝරා නිෂ්පාදනය කළේ ය.
(2) ජෙරොම් ද සිල්වා, ඉන්දු ධර්මසේන හා රුවන්ති චිකේරා නූතන ඉංග්‍රීසි වේදිකාවේ කැපී පෙනෙන නාට්‍ය කරුවෝ ය.
(3) 20 සියවස මුල් භාගයේ ස්වතන්ත්‍ර ඉංග්‍රීසි නාට්‍ය විශාල සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය විය.
(4) ආර්.පී. නිව්ටන් හා නියුමාන් ජුබාල් 20 වැනි සියවසේ 50 දශකයේ දී ඉංග්‍රීසි නාට්‍ය කලාවට වැදගත් සේවයක් ඉටු කළෝ ය.
(5) 20 සියවස වන විට ශ්‍රී ලංකාවේ ඇතැම් පාසල්වල ඉංග්‍රීසි නාට්‍ය සංගම් බිහි විය. (.........)

**28.** එදිරිවීර සරච්චන්ද්‍රගේ 'බව කඩතුරාව' නාට්‍යයට පදනම් වූ ජාතක කතාව කුමක් ද?
(1) සේරිවාණිජ (2) කුස (3) වෙස්සන්තර
(4) චුල්ලධනුග්ගහ (5) ස්වර්ණ හංස (.........)

**29.** සිංහල වේදිකා නාට්‍ය ඉතිහාසයේ ප්‍රථම වතාවට කැරකෙන වේදිකාවක් උපයෝගී කරගත් නාට්‍යය කුමක් ද?
(1) බක්මහ අකුණු (2) ගජමන් පුවත (3) මනරංජන වැඩ වර්ජන
(4) ඉබිකට්ට (5) තට්ටු ගෙවල් (.........)


● පහතින් සපයා ඇති ඡායාරූපවල දැක්වෙන නාට්‍යකරුවන්/නළුවන් හඳුනාගෙන **30** සිට **34** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ඡායාරූපවලට දී ඇති ඉංග්‍රීසි අක්ෂරය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති හිස්තැන තුළ යොදන්න.)


A


B


C


D


E


F

**30.** පීඩිත ජනයා ගේ ජීවිතවල ඇවෙන ප්‍රශ්න අළලා නාට්‍ය නිර්මාණය කළ නිෂ්පාදකයා (.........)

**31.** ශ්‍රී ලංකාවේ ළමා නාට්‍ය කලාවට විශේෂ දායකත්වයක් දැක්වූ නාට්‍යකරුවා (.........)

**32.** උතුරු නැගෙනහිර පළාත්වල නාට්‍ය කලාවේ අභිවෘද්ධියට දායක වූ නාට්‍යාචාර්යවරයා (.........)

**33.** ඉංග්‍රීසි වේදිකාවට රංගනයෙන් දායක වූ විශිෂ්ට නළුවා (.........)

**34.** ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් නිෂ්පාදනය කළ දේශීය නාට්‍යකරුවා (.........)

● නිවැරදි පිළිතුර තෝරා හිස් වරහන තුළ එහි අංකය යොදන්න.

**35.** අභිඥානශාකුන්තලයේ එන පහත සඳහන් පද්‍යයෙන් අදහස් කෙරෙන්නේ කුමක් දැ යි තෝරන්න.
"පෙනේ මහත් වී සුළු දේ සැණෙකින් කැඩුණු බිඳුණු දේ හාවූ සේ
පෙනේ කෙළින් සේ පියොවින් වක් දේ වේගෙන් දුර ළඟ වෙනස නැසේ"
(1) ඉඳුරු දෙවියන් ගේ අශ්වයින් දුවන විලාසය
(2) රජු ගේ රථය වේගයෙන් ධාවනය වන බව
(3) සූර්ය දේවයා ගේ රථය රජුගේ රථයට වඩා වේගවත් බව
(4) රථය ධාවනය වන්නේ කඩතොලු සහිත දුෂ්කර මාර්ගයක බව
(5) රථය ඉදිරියෙන් දිවයන මුවා ගේ වේගය (.........)

**36.** ශකුන්තලෝපාඛ්‍යානයේ දක්නට නොලැබෙන එහෙත් අභිඥානශාකුන්තලයේ දක්නට ලැබෙන අවස්ථාව තෝරන්න.
(1) ශකුන්තලා මේනකා නම් දිව්‍ය අප්සරාවගේ දියණියන් බව
(2) කණ්ව ගේ අසපුව මාලිනී නදිය අසබඩ පිහිටි බව
(3) දුර්වාසස් ඍෂිවරයා ගේ ශාපය
(4) රජු දඩයමේ යාම
(5) ශකුන්තලාට සක්විති රජකු වන පුත්‍රයකු ලැබෙන බව (.........)

**37.** අභිඥානශාකුන්තලයෙහි එන 'කඤ්චුකී' යනු කවරෙක් ද?
(1) රජුගේ ප්‍රධාන අමාත්‍යයා ය.
(2) රජුට උපදෙස් දෙන තැනැත්තෙකි.
(3) රජ මැදුරට පිවිසෙන අමුත්තන් පිළිගන්නා සේවකයා.
(4) රජුට සේවය කරන මහලු බැමිණියකි.
(5) රජු ගේ අන්තඃපුරයේ පාලකයා යි. (.........)

**38.** විජය-කුවේණි පුවත අන්තර්ගත ඓතිහාසික **නොවන** මූලාශ්‍රය කුමක් ද?
(1) මහාවංසය (2) වංසත්ථප්පකාසිනිය (3) රාජාවලිය
(4) කුවේණි අස්න (5) දීපවංසය (.........)

**39.** කුවේණි නාට්‍යයේ "කුවේණිය නැත නැවත එන්නේ - ඈ වනේ තුරු අතර සැඟවිය" ගීතය ගයන්නේ කවුද?
(1) ගායකයෝ (2) දිසාලා (3) ජීවහත්ත (4) දඩයක්කරු (5) පූරක (.........)

**40.** කුවේණි නාට්‍යය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) රාජරත්නාකරයෙහි කුවේණි පුරාවෘත්තය අන්තර්ගත ය.
(2) පුරාවෘත්තයට අනුව කුවේණිය යක්ෂ ගෝත්‍රික මිනිස් කතකි.
(3) කුවේණි නාට්‍යය ප්‍රථම වරට නිෂ්පාදනය වූයේ 1960 දී ය.
(4) එහි දඩයක්කරු ගේ චරිතය රඟපෑවේ විජයරත්න වරකාගොඩ ය.
(5) කොහොඹා කංකාරිය හා වළියක් මංගල්‍යයට කුවේණි පුරාවෘත්තය පදනම් ව ඇත. (.........)

* *

[පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

**II කොටස**

**උපදෙස්:**

✻ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

## A කොටස

**1.** (i) අභිඥානශාකුන්තලය අයත් වන්නේ කවර රූපක ප්‍රභේදයට ද? (ලකුණු 03 යි.)

(ii) ඉහත (i) හි දැක්වූ ප්‍රභේදයේ විශේෂ ලක්‍ෂණ **පහක්** දක්වන්න. (ලකුණු 05 යි.)

(iii) ඉහත (ii) හි දැක්වූ ලක්‍ෂණවලින් අභිඥානශාකුන්තලය සමන්විත දැ යි සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි.)

**2.** (i) සංස්කෘත නාට්‍ය සඳහා භාවිත වන රංගභූමි වර්ග හා ඒවායේ ප්‍රමාණ නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත (i) හි ඔබ නම් කළ රංගභූමි වර්ග අතුරෙන් එකක හැඩය, ප්‍රමාණය, කොටස් හා ඒවායේ නාම රූප සටහනකින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iii) සංස්කෘත නාට්‍යයේ රංග ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**3.** (i) කුවේණී නාට්‍යයේ "අන්ධකාරෙන් දහස් වසරෙක . . . ." ගීතය සම්පූර්ණ කරන්න. (ලකුණු 03 යි.)

(ii) ඉහත (i) හි දැක්වූ ගීතයෙහි අන්තර්ගත පැදි පෙළේ අර්ථය විවරණය කරන්න. (ලකුණු 06 යි.)

(iii) කුවේණී නාට්‍යයේ පළමුවැනි අංකයේ, දඩයක්කරුගේ සම්ප්‍රාප්තිය දක්වා නාට්‍යමය වාතාවරණය ගොඩනැගෙන ආකාරය ආනුෂංගික අංග කෙරෙහි ද අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

## B කොටස

**4.** (i) කබුකි නාට්‍ය සම්ප්‍රදාය විකාසනය වූ අයුරු දක්වන්න. (ලකුණු 04 යි.)

(ii) කබුකි වේදිකාව, එහි කොටස් හඳුන්වාදෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iii) කබුකි නාට්‍යයේ අංග රචනා ක්‍රම පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**5.** (i) 1980 සිට 2000 දක්වා සිංහල වේදිකාවේ කැපී පෙනුණු නාට්‍ය අධ්‍යක්‍ෂවරුන් **දෙදෙනකු** කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04 යි.)

(ii) ඔබ ඉහත (i) හි සඳහන් කළ අධ්‍යක්‍ෂවරුන්ගෙන් **එක්** අයකු ගේ නිර්මාණ **දෙකක්** ගැන විමර්ශනයක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) 2000 වසරෙන් පසු ලංකාවේ සිංහල වේදිකා නාට්‍ය කලාවේ ප්‍රවණතා පිළිබඳ සාකච්ඡාවක් කරන්න. (ලකුණු 06 යි.)

**6.** (i) ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය ප්‍රචලිත ප්‍රදේශ **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය සම්ප්‍රදායේ ආරම්භය හා විකාසය විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(iii) ලංකාවේ පාස්කු නාට්‍යයක රඟ දක්වනු ලබන ප්‍රධාන අවස්ථා පැහැදිලි කරන්න. (ලකුණු 07 යි.)

✻ ✻ ✻

008978

AL/2020/57/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

**නාට්‍ය හා රංග කලාව - සිංහල II**
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය :** ....................................

| | |
|---|---|
| I කොටස | |
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

* ※ **I** කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, **II** කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* ※ **II** කොටස – **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

※ එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **වරහන තුළ** ලියන්න.

**1.** ප්‍රාසංගික කලාවට අදාළ නිවැරදි වරණය තෝරන්න.
(1) ප්‍රේක්ෂක ප්‍රතිචාර අනුව වෙනස් කළ නොහැක.
(2) සාමූහික ව පිරිසක් විසින් ඉදිරිපත් කරන්නක් විය යුතු ය.
(3) ජීවමාන ප්‍රේක්ෂක පිරිසක් සිටීම අවශ්‍ය ය.
(4) වාචික අභිනයෙන් තොර විය හැකි ය.
(5) සජීවී රූපවාහිනී විකාසයක් ප්‍රාසංගික කලාවක් සේ සැලකිය හැකි ය. (.........)

**2.** නාට්‍ය කලාව,
(1) නාට්‍ය පෙළ මත පමණක් ම රඳා පවතින්නකි.
(2) ප්‍රාග්-ඓතිහාසික යුගයේ ප්‍රභවයට පත් කලාවකි.
(3) එහි නාමය නෘත් ධාතුවෙන් ප්‍රභවය වී ඇත.
(4) සෙසු ප්‍රාසංගික කලා හා සැසඳීමේ දී සීමාසහිත කලාවකි.
(5) පරායත්ත කලාවක් ලෙස සැලකිය හැකි ය. (.........)

**3.** පසුතල සඳහා චිත්‍ර වස්ත්‍ර බහුල වශයෙන් භාවිතයට ආවේ කුමන යුගයක ද?
(1) රෝම (2) මධ්‍යකාලීන (3) එළිසබෙතීන
(4) පුනරුදය (5) රොමැන්ටික් (.........)

**4.** ග්‍රීක නාට්‍ය රචක ඊස්කිලස් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඔරෙස්ටෙයියා ඔහුගේ ශ්‍රේෂ්ඨතම නිර්මාණයයි.
(2) ඊස්කිලස් ත්‍රෛරූපක රචනා කළේ නැත.
(3) ඔහු සටුර නාට්‍ය රචකයකු බවට සාධක නැත.
(4) ශෝකෝත්පාදකයට තෙවැනි නළුවා එක් කළේ ඔහු ය.
(5) ඔහුට නාට්‍ය තරගවල ප්‍රථම ස්ථාන හිමිවූයේ නැත. (.........)

02020000380113978

[දෙවැනි පිටුව බලන්න.

- ප්‍රශ්න අංක **5 - 10** දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා කරණු/සංකල්ප/නාම පහ බැගින් දී ඇත. ඒ අතර සෙසු පද හා **නොගැළපෙන** පදය බැගින් තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**5.** (1) ලයිසිස්ට්‍රාටා (2) මණ්ඩූකයෝ (3) හිපොලීටස් (4) ප්ලූටස් (5) කුරුල්ලෝ (.........)

**6.** (1) සිංහාසනය (2) පැරඩොස් (3) කච්චිචිය (4) එක්කුක්ලීමා (5) දොඹකරය (.........)

**7.** (1) ප්ලැටියා (2) චෙස්ටර් (3) ටවුන්ලි (4) යෝක් (5) කවන්ට්‍රි (.........)

**8.** (1) ධාරා පහන් (2) ස්පොට් පහන් (3) ස්මෝක් මැෂිම (4) වර්ණ චක්‍ර (5) ස්ට්‍රිප් ලාම්පු (.........)

**9.** (1) පසුතල (2) වේෂභූෂණ (3) ආලෝකය (4) අංග රචනය (5) සංගීතය (.........)

**10.** (1) ප්‍රේක්ෂාලය (2) ඔර්කීස්ට්‍රා (3) ස්කීනී (4) අරීනා (5) පැරඩොයි (.........)

**11.** ග්‍රීක ශෝකෝත්පාදකයක වීරයා ගේ භාග්‍ය පරිවර්තනය සඳහා ඇරිස්ටෝටල් යෙදූ පාරිභාෂික පදය කුමක් ද?
(1) ප්‍රත්‍යාවර්තනය (2) ප්‍රත්‍යභිඥානය (3) කතාර්සිස් (4) අනාවරණය (5) ආකුලීකරණය (.........)

**12.** පහත වරණ අතුරින් මොරලිටි නාට්‍යය තෝරන්න.
(1) කායින් සහ ආබෙල් (2) නෝවාගේ නැව (3) සාන්ත නිකලස් (4) දෙවැනි එඬේරා (5) මිනිස් වර්ගයා (.........)

**13.** සංගීතයෙන් රුකුලක් **නො ලබාගත්** ප්‍රකට සිංහල නාට්‍යය තෝරන්න.
(1) අන්දර මල් (2) ගජමන් පුවත (3) කැලණි පාලම (4) කොන්තරාත්තුව (5) පුන්තිලා (.........)

**14.** රොමැන්ටික් රීතිය අනුව නිර්මාණය වූ නාට්‍යය තෝරන්න.
(1) පියර්ගුන්ට් (2) මිස් ජුලී (3) ද ගෝස්ට් (4) ද බ්‍රූගන් (5) හෙඩා ගාබ්ලර් (.........)

**15.** යථාර්ථවාදී නාට්‍ය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෙම නාට්‍යවල චරිත පැතලි බවින් යුතු ය.
(2) ආත්මභාෂණ බහුල වශයෙන් භාවිත විය.
(3) රුසියාවෙන් ආරම්භ වී යුරෝපය පුරා ව්‍යාප්ත විය.
(4) ගතානුගතික තේමා හා අතාර්කික සිදුවීම්වලින් බැහැර විය.
(5) හෙන්රි බෙක්ගේ "ද වල්චර්ස්" යථාර්ථවාදී නාට්‍යයකි. (.........)

**16.** "The Myth of Sisyphus (ද මිත් ඔෆ් සිසිෆස්)" නාට්‍යය අයත් වන්නේ කුමන නාට්‍ය රීතියට ද?
(1) යථාර්ථවාදී (2) සංකේතවාදී (3) විසංගත (4) ආඛ්‍යාන (5) ප්‍රකාශනවාදී (.........)

**17.** මධ්‍යකාලීන යුරෝපයේ ජේසුස් වහන්සේ ගේ "අවසාන රාත්‍රි භෝජනය" රංගගත කිරීම භාර කොට තිබුණේ කුමන වෙළඳ ශ්‍රේණියකට ද?
(1) පාන් පුළුස්සන්නන්ට (2) සන්නාලියන්ට (3) කම්මල්කරුවන්ට (4) නැව් සාදන්නන්ට (5) රෙදි අපුල්ලන්නන්ට (.........)

**18.** පහත සඳහන් නාට්‍ය අතුරින් ශෝකජනක නාටකය තෝරන්න.
(1) මෙෂර් ෆෝ මෙෂර් (2) ද ට්වෙල්ෆ්ත් නයිට් (3) ද ටේමිං ඔෆ් ද ෂ්රූ (4) සිම්බලින් (5) කිං ලියර් (.........)

**19.** ශේක්ස්පියර්ගේ සමකාලීනයකු **නොවන්නේ** කවුරු ද?
(1) බෙන් ජොන්සන් (2) ක්‍රිස්ටෝෆර් මාලෝ (3) ජෝන් ලයිලි
(4) වෝල්ටර් හේසන්ක්ලෙවර් (5) රොබට් ග්‍රීන් (.........)

**20.** ජුලියස් සීසර් නාට්‍යය ප්‍රථම වතාවට රඟ දැක්වුණේ කුමන රඟහලේ ද?
(1) ස්වෝන් (2) ග්ලෝබ් (3) ෆෝචූන්
(4) රෝස් (5) කර්ටන් (.........)

008978

**21.** නාට්‍ය පෙළක උපයුක්ත භාෂාව ගැන කියැවෙන වඩාත් ම නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) රංග විධාන ශාස්ත්‍රීය භාෂාවෙන් පමණක් තිබිය යුතු ය.
(2) ප්‍රේක්ෂකයා ආකර්ෂණය කිරීම ඒකායන අරමුණ විය යුතු ය.
(3) රූපණයේ පහසුව පමණක් අරමුණු කොට ගැනීම.
(4) උත්ප්‍රාසය දැනවීම කෙරෙහි අවධානය යොමු කිරීම.
(5) ලෝකධර්මී හා නාට්‍යධර්මී භේදය නොසැලකීම. (.........)

**22.** වේෂභූෂණ හා අංග රචනා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) එම ශිල්පීන් ගේ කාර්ය රූප ලාවණ්‍ය ශිල්පියකු ගේ කාර්ය හා සමාන ය..
(2) උපරිම ව යෙදිය යුත්තේ ලෝකධර්මී සම්ප්‍රදායේ දී ය.
(3) චරිතයේ ලක්ෂණ යටපත් නොවන පරිදි සිදු කළ යුතු ය.
(4) සරල නොවිය යුතු ය.
(5) නාට්‍යයේ තේමාවට හා ශෛලියට පමණක් ම සීමා නොවිය යුතු ය. (.........)

**23.** ශෝකෝත්පාදකයක කතා වස්තුව සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ආකුලීකරණය හා අනාවරණය ශෝකෝත්පාදකයේ සාර්ථකත්වයට බලපායි.
(2) ශෝකෝත්පාදකයේ වීරයා ශාපලත් පවුලකින් පැවත එන්නකු නොවිය යුතු ය.
(3) කතා වස්තුව අනිවාර්යයෙන් සංකීර්ණ විය යුතු ය.
(4) පුරාවෘත්තයකින් පමණක් ම සකසාගත යුතු ය.
(5) පුරාවෘත්තයේ සිද්ධි එම අනුපිළිවෙළින් ම ඉදිරිපත් කළ යුතු ය. (.........)

**24.** නාට්‍ය විචාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍යයේ සමස්තය නොව එක් එක් අංග විචාරයට ලක් කළ යුතු ය.
(2) විචාරයේ දී නිර්මාණකරුවා ගේ පළපුරුද්ද අවධානයට ගත යුතු ය.
(3) නාට්‍යකරුවා ගේ මතවාදයට අප එකඟ නම් පමණක් විචාරය කළ යුතු ය.
(4) විචාරය නාට්‍ය කලාවේ ප්‍රගතියට බාධාවක් බව තේරුම් ගත යුතු ය.
(5) පූර්වනිශ්චිත නිගමනයක සිට විචාරය නොකළ යුතු ය. (.........)

**25.** කෙටි නාට්‍ය සම්බන්ධ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) අංක කිහිපයක් ඇත.
(2) ජවනිකාවලට නො බෙදේ.
(3) රංග කාලය සලකා කළ වර්ගීකරණයකි.
(4) රචනය සඳහා විශේෂ ශිල්පීය ඥානයක් අවශ්‍ය නො වේ.
(5) කෙටි නාට්‍ය සඳහා කෙටි කථා යොදාගැනීම අනුචිත ය. (.........)

**26.** ඊඩිපස් නාට්‍යයේ ගායන වෘන්දය වේදිකාවට පැමිණෙන්නේ කුමන අවස්ථාවේ ද?
(1) පූර්වරංගය ආරම්භ වත් ම
(2) පූර්වරංගය නිමාවීමට පෙර
(3) පළමුවැනි අංකය ආරම්භයේ
(4) පූර්වරංගයේ ඊඩිපස් මහජනයා ඇමතීමෙන් පසු
(5) පළමුවැනි අංකය අවසානයේ (.........)

**27.** ඊඩිපස් නාට්‍යයේ ප්‍රථම වතාවට වේදිකාවට පිවිසෙන ගායන වෘන්දය ආයාචනා කරන්නේ කුමන දෙවිවරුන්ට ද?
(1) දියොනීසස්, ඇපොල්ලෝ, ඇතීනා (2) සියුස්, ඇතීනා, ඒරිස්
(3) හර්මීස්, ආටෙමිස්, ඇපොල්ලෝ (4) ඇතීනා, ආටෙමිස්, ෆීබස්
(5) පොසීඩන්, ඒරිස්, ෆීබස් (.........)

01020000380113978

**28.** "නුඹට අනුකම්පා කරමි - මට ගසන ඔය ඇණුම් පද
මතු දවස දහසක් මුවින් - නුඹ වෙත ම එල්ල වේවි."
ඊඩිපස් නාට්‍යයේ එන ඉහත සඳහන් සංවාද ඛණ්ඩය කියන්නේ කවුද?
(1) ගායන වෘන්දය (2) යොකස්ටා (3) ක්‍රියොන්
(4) ඊඩිපස් (5) ටෙරේසියස් (………)

**29.** ළදරු ඊඩිපස් කොරින්තයේ ගොපල්ලාට බාර දුන්නේ කුමන ස්ථානයක ද?
(1) සිතිරියන් කඳුවැටියේ (2) පාර්නේසස් කඳුවැටියේ (3) ඩෙල්ෆි කඳු පා මුල
(4) ඔලිම්පස් කන්දේ දී (5) ඉස්මෙනුස් නදී තෙර (………)

**30.** ඊඩිපස් නාට්‍යය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඊඩිපස් නාට්‍යය අංක පහකින් සමන්විත ය.
(2) කාලානුක්‍රමික ලෙස කතාවක් ඉදිරිපත් කර යි.
(3) ඊඩිපස් රාජත්වයෙන් නෙරපීමට ක්‍රියොන් කුමන්ත්‍රණය කර යි.
(4) ඊඩිපස්, ස්ෆින්ක්ස් ගේ ප්‍රෙහේළිකාව විසඳන්නේ ලායුස් ඝාතනයෙන් පසු ය.
(5) යොකස්ටා ගේ හිස් පළඳනාවේ ඇති කටුවකින් ඊඩිපස් දෑස් අඳ කරගනී. (………)

**31.** "නෑ කැසියස් ඇහැට ඇහැ පේන්නේ නැහැනේ . . . . ඒ වගේ මටත් මගෙ මූණ පෙන්නේ නැහැනේ"
මෙම සංවාදයේ අර්ථය කුමක් ද?
(1) තම මුහුණ දැකිය හැක්කේ කැටපතේ ඡායාවෙන් බව
(2) යමෙකුට තම පියවි ස්වභාවය නොපෙනෙන බව
(3) බ්‍රූටස් හරිහැටි වටහාගත්තේ කැසියස් බව
(4) කැටපතක් නොමැති වීම ලොකු පාඩුවක් බව
(5) බ්‍රූටස් ව්‍යාකූලත්වයට පත් ව සිටින බව (………)

**32.** ජූලියස් සීසර් නාට්‍යයේ තුන්වැනි අංකයේ තුන්වැනි දර්ශනයේ ඝාතනයට ලක් වන්නේ කවුද?
(1) මරුලස් (2) කස්කා (3) සින්නා
(4) ෆ්ලේවියස් (5) සිම්බර් (………)

**33.** ජූලියස් සීසර් නාට්‍යයේ තුන්වැනි අංකයේ පළමුවැනි දර්ශනයේ සීසර්ට දීමට පෙත්සමක් රැගෙන එන්නේ කවුද?
(1) ආටිමිඩෝරස් (2) පේන කියන්නා (3) පබ්ලියස්
(4) ඩෙසියස් (5) පොපිලියස් (………)

**34.** ජූලියස් සීසර් නාට්‍යයේ කැල්ෆර්නියාගේ සිහිනය ඩෙසියස් බ්‍රූටස් අර්ථ ගන්වන්නේ කෙසේ ද?
(1) සීසර්ට සිදුවීමට නියමිත දරුණු විපත්තියක සලකුණු පෙන්වන්නක් ලෙස
(2) සෙනෙට් සභාවට නොගියහොත් බිහිසුණු අනතුරක් විය හැකි බව
(3) සීසර් නිසැකව ම රෝමයේ අධිරාජයා වන බව
(4) ශ්‍රේෂ්ඨ මිනිසුන් පැමිණ සීසර්ට ගෞරව සම්මාන පුදන බව
(5) රෝමය සීසර් ගෙන් නව ජීවයක් හා පෝෂණයක් ලබාගන්නා බව (………)

**35.** ජූලියස් සීසර් නාට්‍යයේ සීසර් "ඔලිම්පස් කන්ද හොලවන්න ද හදන්නේ?" යැ යි පැවසීමේ අර්ථය කුමක් ද?
(1) තමා ඔලිම්පියානු දේව මණ්ඩලය හා සම තත්ත්වයේ ලා සැලකීම
(2) කුමන්ත්‍රණකරුවන් නිෂ්ඵල ප්‍රයත්නයක යෙදීසිටින බව
(3) තමා ගත් තීරණයේ වෙනස් නොකරන බව
(4) තමා හැර අන් සියලු දෙනා තත්ත්වයෙන් පහත් බව
(5) තමා ගත් තීරණය නිවැරදි බව (………)

**36.** රුකඩ ගෙදර නාට්‍යයේ දෙවැනි අංකය ආරම්භයේ පසුතලය සකසා ඇති ආකාරයෙන් කුමක් අර්ථවක් වේ ද?
(1) නත්තල සැමරීම නිමා වී ඇති බව යි.
(2) නත්තල් තෑගි නිවැසියන් අතර බෙදාහදාගෙන ඇති බව යි.
(3) රුකඩ ගෙදර පුහු ආටෝපය ගිලිහෙමින් පවතින බව යි.
(4) නත්තල් සමය අවසන් වන තෙක් නත්තල් ගස ඉවත් නොකළ යුතු බව යි.
(5) නෝරා තුළ ඇති නොසන්සුන් බව යි. (………)

[පස්වැනි පිටුව බලන්න.

**37.** හෙල්ම නෝරා අමතන විට 'පුංචි' යන විශේෂණ පදය යෙදීමේ අර්ථය වන්නේ කුමක් ද?
(1) හෙල්ම නෝරාට දක්වන අසීමිත ආදරය යි.
(2) තම දරුවන් මෙන් ම බිරිඳ ද සුරතල් කළ යුතු වීම යි.
(3) තමන්ට එසේ අමතනු ලැබීමෙන් නෝරා සතුටට පත්වන බැවින්.
(4) නෝරා පිළිබඳ හෙල්මගේ ඇති අවතක්සේරුව යි.
(5) නෝරා සහ හෙල්ම අතර දැඩි වයස් පරතරයක් තිබීම යි. (………)

**38.** ඉබ්සන් රූකඩ ගෙදර නාට්‍යයේ දොස්තර රන්ක් රෝගියෙක් ලෙස නිරූපණය කිරීමෙන් කුමක් අදහස් කළේ ද?
(1) මරණය හමුවේ වුව ද මිනිසා ගේ ජීවිතාශාව පෙන්වීමට
(2) සිය නාට්‍ය බොහෝවක රෝගීන් ගේ චරිත ඇතුළත් කිරීමේ පුරුද්ද
(3) පවුලේ හිතවතකු මගින් අතීතය අනාවරණය කිරීමේ අවශ්‍යතාව
(4) වෛද්‍යවරයකු, රෝගියකු ලෙස නිරූපණයෙන් ඇති වන උත්ප්‍රාසය නිසා
(5) නෝර්විජියානු සමාජය රෝගාතුර ව ඇති බව කියා පෑමට (………)

**39.** රූකඩ ගෙදර නාට්‍යයේ එන "තරන්තලා" යනු කුමක් ද?
(1) වේග රිද්මයෙන් යුත් ඉතාලි ජන නර්තනයකි
(2) කැප්රි දිවයිනේ කාන්තා නර්තනයකි
(3) නෙපොලිටානු මසුන් අල්ලන්නියකගේ චරිතයක්
(4) නෝර්විජියානු සමාජ නර්තනයකි
(5) දිවි මකුළුවකුට කියන නාමයකි (………)

**40.** "අනේ ටෝවල්ඩ් තව දුරටත් ඔය ආශ්චර්යය ගැන මගේ පිළිගැනීමක් නැහැ" රූකඩ ගෙදර නාට්‍යයේ එන එම සංවාදයේ ආශ්චර්යය යන්නෙහි අර්ථය කුමක් ද?
(1) පොරොන්දු පත්‍රය රහසක් ලෙස තබාගැනීම
(2) රන්ක් තමාට යම් මුදලක් උරුමකොට ඇතැ යි සිතීම
(3) තම නිවසේ තමාට අනන්‍යතාවක් හිමි වේ ය යි පැවති විශ්වාසය
(4) ඔවුන් ගේ ගැටලුව ආශ්චර්යමත් ලෙස විසඳේය යි සිතීම
(5) අනපේක්ෂිත යමක් සිදු වේ ය යි නෝරා තුළ පැවති බලාපොරොත්තුව (………)

* *

0002494

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

නාට්‍ය හා රංග කලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

## II කොටස

**උපදෙස්:**

※ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

### A - කොටස

**1.** (i) ග්‍රීක නාට්‍ය රචකයන් අනුගමනය කළ පශ්චාද්දෘෂ්ටිකථන රීතිය යනු කුමක් දැ යි කෙටියෙන් දක්වන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත (i) හි සඳහන් රීතියට අනුව පෙළ ගොඩනැගීමේ දී පුරාකතාවේ සිදුවීම් නාට්‍යයට බද්ධකොට ඇති ආකාරය ඊඩිපස් නාට්‍ය ඇසුරින් පෙන්වාදෙන්න. (ලකුණු 05 යි.)

(iii) ඊඩිපස් නාට්‍යය, සංකීර්ණ ශෝකෝත්පාදකයක් ලෙස සැලකෙන්නේ මන්දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**2.** (i) ජූලියස් සීසර් නාට්‍යයේ සීසර් තමා සමාන කොට දක්වන්නේ කවර නම් වස්තූන්ට ද? (ලකුණු 02 යි.)

(ii) ඉහත (i) හි පරිදි සමාන කිරීමෙන් අනාවරණය වන ඔහුගේ චරිත ලක්ෂණ නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

(iii) කැසියස් විසින් සීසර් ගේ දුර්වලකම් හුවා දක්වනු ලබන්නේ කෙසේ දැ යි පහදන්න. (ලකුණු 07 යි.)

**3.** (i) රූකඩ ගෙදර නාට්‍යයේ නෝරා තමා ණය මුදලක් ගත් බව හෙල්මර් ගෙන් වසන් කරන්නේ මක් නිසා ද? (ලකුණු 04 යි.)

(ii) තමා ලබාගත් ණය මුදල පියවීම සඳහා නෝරා විසින් ගනු ලැබූ විවිධ ක්‍රියා මාර්ග හා මුහුණ පෑ දුෂ්කරතා පෙන්වාදෙන්න. (ලකුණු 05 යි.)

(iii) ටෝවල්ඩ් හෙල්මර් ගේ ආත්මාර්ථකාමිත්වය නෝරා පැහැදිලි ව පසක් කරගන්නේ නාට්‍යයේ කුමන අවස්ථාවේ ද? එය නෝරාට කෙබඳු බලපෑමක් කළේ ද? සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

### B - කොටස

**4.** (i) කලාව යනු කුමක් ද? කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03 යි.)

(ii) කලාව හා ශිල්ප වශයෙන් කෙරෙන වර්ගීකරණයේ පදනම පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iii) ව්‍යවහාරික කලා සහ ලලිත කලා පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**5.** (i) 'අභිරූපණය' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි.)

(ii) අභිරූපණ රංගයක් සඳහා ආනුෂංගික අංගවල උපයෝගිතාව පෙන්වාදෙන්න. (ලකුණු 06 යි.)

(iii) රූපණය පෝෂණය කිරීම සඳහා අභිරූපණය කොතෙක් දුරට ඉවහල් වේ දැ යි පහදන්න. (ලකුණු 06 යි.)

**6.** (i) ප්‍රාසංගික කලාවක ප්‍රේක්ෂකයා වැදගත් වන්නේ මන්ද? ඉතා කෙටියෙන් දක්වන්න. (ලකුණු 02 යි.)

(ii) ප්‍රේක්ෂක තෘප්තිය යනු කුමක් දැ යි දක්වා, ප්‍රේක්ෂක තෘප්තිය කෙරෙහි බලපාන සාධක පෙන්වාදෙන්න. (ලකුණු 06 යි.)

(iii) නාට්‍ය කලාවේ අභිවෘද්ධිය උදෙසා ප්‍රේක්ෂක සහභාගිත්වයේ සහ ප්‍රතිචාරයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 07 යි.)

※ ※ ※

මෙතැනින් කපන්න.

0002496